උකුවෙල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 28 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභා ගොඩනැගිල්ලේ දෙවන මහළ සහ හෙළ බොජුන්හල යන ඉදිකිරීම් දෙකෙහි නිම් වැඩ වටිනාකම වූ රු.7,412,417 ක් ගොඩනැගිලි යටතේද, ඒ සඳහා ප්‍රතිපූර්ණය වියයුතු රු.4,877,780 ණයගැතියන් යටතේද, කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවියයුතු රු.5,815,534 ක් ණය හිමියන් යටතේ ද ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සභාව සතු ගුරලවෙල දකුණ සුසාන භූමියේ වටිනාකම රු.200,000 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබූ අතර, ඉඩම් 7 ක වටිනාකම වූ රු.128,000 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාව සතු සුසාන භූමි 35 ක සහ පොදු නළ ළිං 67 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) රු.460,027 ක් වූ තොග අයිතම 441 ක වටිනාකම හා රු.91,460 ක් වූ ආයුර්වේද තොගයේ වටිනාකම අවසන් තොගය යටතේ දක්වා නොතිබුණි.

(ඉ) මුද්දර ගාස්තු ආදායම රු.8,663,137 ක් සහ ලැබියයුතු මුද්දර ගාස්තු ආදායම රු.6,941,317 ක් අඩුවෙන් ද වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම සහ ලැබියයුතු උසාවි දඩ ආදායම රු.92,477 ක් වැඩියන්ද දක්වා තිබුණි.

(ඊ) 2014 සහ 2015 වර්ෂ තුළ ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා දරා තිබූ රු.3,295,969 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, සම්මන්ත්‍රණ ශාලාව ඉඳකිරීමේ වටිනාකම රු.614,375 ක් වැඩියෙන් ප්‍රාග්ධනිතකර තිබුණි.

(උ) රු.583,868 ක් වටිනාකමින්යුතු ණයගැති ශේෂ 15 ක් සහ රු.3,512,586 ක් වටිනාකමින් යුතු ණයහිමි ශේෂ 33 ක් ගිණුම්ගතකර නොතිබූ අතර, කර්මාන්ත 6කට අදාළ ණයගැති ශේෂය රු.482,456 ක් වැඩියෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.29,699,381 ක් වූ ගිණුම් විෂයයන් 5 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගි ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, රු.9,651,715 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතුව රු.14,313,320 ක් වූ අතර, ඊට වර්ෂ 1කට වැඩි වර්ෂ 3 කට අඩු කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.2,244,489ක ශේෂයක්ද වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.380,442ක ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 7 ක වටිනාකම රු.16,857,256 ක්වූ අතර, ඊට වර්ෂ 1 කට වැඩි වර්ෂ 3 කට අඩු කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.605,986 ක ශේෂයක්ද වර්ෂ 3 ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.3,911,867 ක ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 9 කට අදාළ එකතුව රු.125,658,985 ක්වූ ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

-----------------------------------------------------

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ හා වෙනත් | |
| (i) 2015 ජූලි 14 දිනැති අංක 04 /2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - මිල ගණන් කැඳවීමකින් තොරව වාහන 8 ක් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණ ආවරණ සිදුකරගෙන රු.326,948 ක් ගෙවීම් කර තිබුණි.<br>- පුස්තකාල 6 සඳහා මිල ගණන් කැඳවීමක් සිදුනොකර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණාවරණ ලබාගෙන රු.31,671 ක් ගෙවීම් කර තිබුණි. |

(ඇ) (ii) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය — 2007 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරුවක් කර නොතිබුණි.

(iii) 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 වගන්තිය

- තක්සේරුගත මාසික කුලිය යටත් පිරිසෙයින් වසර 5 කට වරක්වත් සංශෝධනය කළයුතු වුවත්, කඩ කාමර 65 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු නොකර එකම කුළියක් අයකරමින් පැවතුණි.
- A,C හා D පොදු වෙළඳපල කඩ කාමර කුලී 2010 දෙසැම්බර් 22 දිනැතිව සහ වෙළඳපොල B කොටසේ කඩ කාමර 21 ක කුලී 2015 මැයි 13 දිනැතිව තක්සේරු කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින දක්වාම එම කුලිය අය කිරීමට සහ නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,232,423 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,577,241 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,344,818ක පහත වැටීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් නිරීක්ෂණ සහ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

(අ) මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා ආදායම් ප්‍රභවයන් 3ක රු. 8,546,638 ක ආදායම් අඩුවීම හා වියදම් විෂයයක රු.709,798 ක වියදම වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

(ආ) මුළු පුනරාවර්තන වියදම රු.42,479,163 ක් වූ අතර, ඉන් වැටුප් සඳහා පමණක් රු.29,058,485 ක් හෙවත්, සියයට 68 ක් වැයකර තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිශතයේ අඩුවීමක් පෙන්නුම් කෙරේ.

(ඈ) මුළු වියදම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සමාලෝචිත වර්ෂයේ දී එම ප්‍රතිශතයේ ඉහලයාමක් පෙන්නුම් කෙරෙන අතර, මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් එමගින් පෙන්නුම් නොකෙරුණි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 වරිපනම් බදු
--------------

හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.786,657 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 3 ට වඩා වැඩි කාලයකට අයත්, රු.215,392 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.2 වෙනත් ආදායම්
------------------

(අ) අක්කර බදු
---------------

හිඟ හිටි අක්කර බදු ශේෂය රු.31,334 ක් වූ අතර, මෙම ශේෂ වසර 7 ක කාලයක සිට පැවතුණි.

(ආ) ජල ගාස්තු
------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු.1,710,835ක් වූ අතර, එම ශේෂය තුළ වසර 3ට වැඩි කාලයක් ඉක්ම වූ රු.120,185 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ii) ජල සැපයුම විසන්ධිකර තිබූ ජල පාරිභෝගිකයන් 74 දෙනෙකුගෙන් රු.214,623 ක මුදලක් අයවීමට තිබූ අතර, ඒ තුළ වර්ෂ 3 කට වැඩි කාලයක සිට අයවියයුතු රු.111,084 ක ශේෂයක් පැවතුණි.

(ඇ) කසල ගාස්තු
----------------

හිඟ හිටි කසල ගාස්තු ශේෂය රු.13,531 ක් වූ අතර, එම ශේෂය වසර 3 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු. 460,727 ක මුදලක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.10,125,220 ක මුදලක් අයවියුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව, 2016 වර්ෂය සඳහා ඕවිලිකන්ද මහජන පුස්තකාලයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම මගින් තාක්ෂණ විෂය ගමට ගෙන යාමත්, ගමේ සියළු පාසැල් සිසුන්ට හා ප්‍රදේශයේ තරුණ තරුණියන්ට තොරතුරු තාක්ෂණ දැනුම වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව සලසාදීමත් ප්‍රධාන අරමුණක් වී තිබුණද, එකී මධ්‍යස්ථානය පිහිටුවීමට කටයුතුකර නොතිබුණි.

(ආ) පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වාහන හා යන්ත්‍රසූත්‍ර සේවයේ යෙදවීමට ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැතිවීම නිසා වාහන රියදුරන්, යන්ත්‍ර ක්‍රියාකරුවන් හා යන්ත්‍ර සහායකයින් අනුමතකර බඳවා ගැනීම අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ප්‍රධාන අරමුණක් වී තිබුණද, එම කාර්යය ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභා ගොඩනැගිල්ල පිහිටි හෙක්ටයාර් 0.1827 ක ඉඩම් කොටසට අදාළ පැවරුම් නියෝග සභාවට ලැබී නොමැති බැවින් ප්‍රාදේශීය සභාව නමින් ලියාපදිංචි කරගත නොහැකිව තිබූ අතර, එම ඉඩමේ මුල් අයිතිකරු විසින් කොළඹ දිස්ත්‍රික් උසාවියේ ගොනුකර තිබූ බූදල් නඩුව අනුව ඔහු රජයට පවරාදුන් කොටසට අමතරව පර්චස් 16ක බිම් කොටසක් සභාව භුක්ති විඳින බව දක්වා ඇති අතර, ඉඩම නැවත මැන ගැටළුව විසඳීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.1,951,000 ක් වටිනා ඉඩම් 13ක ඔප්පු සභාව නමින් ලියාපදිංචි කළ දින සිට වර්ෂ 2 සිට වර්ෂ 15 ක් දක්වා කාලයක් ගතවී ඇතත්, එම ඉඩම් පිහිටි ස්ථාන නිවැරදිව හඳුනාගෙන නොතිබුණි .

(ඇ) සභාවේ කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 8 ක පුරප්පාඩු 17 ක් සහ තනතුරු 2ක අතිරික්තතා 3 ක් පැවතුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ගොඩනැගිලි අයදුම්පත් 430 කින් 200 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත්, ඉන් අයදුම්පත් 19 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත්කර තිබුණි.

(ආ) " E " ණැන පියස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සභාවේ ස්ථාපිත කිරීමට නියමිත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා 2014 ජූනි 25 දින රු.594,061 ක් වටිනාකමින් යුතු කාර්යාල උපකරණ අයිතම 17 ක් ලබාදී තිබූ නමුත්, එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබූ අතර එම උපකරණ වලින් බොහොමයක් කාර්යාලයේ කටයුතු සඳහා යොදවාගෙන තිබුණි.

3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2015 මැයි 13 දින සභාවට ලැබී තිබූ RD-9449 ට්‍රැක්ටරය 2017 අප්‍රේල් 9 දින දක්වාම ධාවනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඇල්කඩුව නගරයේ ඇති පැරණි පුස්තකාලය හා ආයුර්වේද බෙහෙත් ශාලාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
------------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේදී නව වරිපනම් තක්සේරු කටයුතු සිදුකිරීම සඳහා රු.1,128,415 ක් වැයකර තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් එම වාර්තා ලබාගෙන නව වරිපනම් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හිටපු නාගරික මන්ත්‍රීවරයෙකු වන, සභාවේ මහජන පුස්තකාලයේ පුස්තකාල සහායක ලෙස සේවය කරන නිලධාරියෙකුට රාජකාරිය සඳහා විධිමත්ව වාර්තා නොකර සහ රාජකාරි ඉටු නොකර තිබියදී 2013 සිට 2015 දෙසැම්බර් මස දක්වා රු.827,172 ක් වැටුප් හා දීමනා ගෙවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වා සුදුසු කටයුතු කිරීමට පියවරගෙන නොතිබුණි.

3.6 හඳුනාගත් අලාභ
--------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) එක් ගමකට එක් වැඩක් වැඩසටහන යටතේ තැන්න අතුරු මාර්ගය සංවර්ධනය සඳහා සභා අරමුදලින් 2014 දී ගෙවන ලද රු.147,182 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, ප්‍රාදේශීය ලේකම් වෙතින් ප්‍රතිපූර්ණය වී නොතිබූ බැවින් එකී මුදල සභා අරමුදලට සිදුවූ පාඩුවක් වී තිබුණි.

(ආ) 2005 වර්ෂයේදී ගැසට්කර ප්‍රසිද්ධ කළ මාර්ගයක් වූ බෝවත්ත නුගපිටිය මාර්ගය සංවර්ධනය කිරීමේදී පෞද්ගලික ඉඩමකට හානි සිදුවීම හේතුවෙන් මාතලේ දිසා අධිකරණයේ පවරා තිබූ නඩුව කාලාවරෝධී බව අදාල නීතිඥවරුන් දැනුවත් නොවී වර්ෂ ගණනාවක් නඩුව පවත්වාගෙනයාම හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු වශයෙන් ගෙවා තිබූ රු.210,866 ක මුදල සභා අරමුදලට පාඩුවක්ව තිබුණි.

(ඇ) ඉඩම් හිමිකරුගේ විරෝධතාවය තිබියදී 2012 අගෝස්තු මස ගැසට්කර තිබූ කැන්දගොල්ලාමඩ මාර්ගය පළල් කොට සැකසීමට සභාව කටයුතු කිරීම හේතුවෙන් අදාල ඉඩම් හිමියා විසින් 2012 සැප්තැම්බර් 25 දින මාතලේ දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. දැනට අදාළ මාර්ගය සංවර්ධනය කිරීමට සභාව අපේක්ෂා නොකරන බව දන්වා පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා තිබුණද, අදාළ නඩුව අවසන් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, නීතිඥ ගාස්තු ලෙස රු.123,500 ක් වියදම වී තිබුණි.

3.7 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාද
------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් පාලන ආයතන සේවා (නව වැඩ) පුස්තකාල සංවර්ධන යටතේ උකුවෙල මහජන පුස්තකාලය අලුත්වැඩියා කිරීම සඳහා රු.304,580 ක් වටිනා කම්බි මිලදීගෙන තිබූ අතර, 2017 අප්‍රේල් 9 දින වන විටත් එම ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. තවද මිලදීගෙන තිබූ කම්බිවලින් රු.78,340ක් වටිනාකමින් යුතු කම්බි විධිමත් පූර්ව අනුමැතියකින් තොරව සභාවේ වෙනත් ව්‍යාපෘති සඳහා නිකුත්කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිමේ ජාතික වැඩසටහන යටතේ අනුමත වී තිබූ රු.5,650,000 ක් වූ ව්‍යාපෘති 11 ක්ම සෘජු ශ්‍රමය ලබා ගැනීමේ අපහසුතාවය මත 2017 පෙබරවාරි 1 දින වන විටත්, ක්‍රියාත්මක කර නොතිබුණු අතර, සභා පොදු අරමුදල් මඟින් ඉටුකිරීමට අනුමත වී තිබූ ප්‍රතිපාදන මුදල රු.3,867,626 ක් වූ කර්මාන්ත 22 ක් ද ඉටුකර නොතිබුණි.

3.8 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

ගුරුලවෙල දකුණ සුහද ප්‍රජා මූල සංවිධානයේ ජල යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම

------------------------------------------------------------------------------------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.2,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ යථෝක්ත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සෘජුශ්‍රම පදනම මත සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ළිඳ සහ පොම්පාගාරය සාදා ඇති භූමියේ හිමිකම ඉඩම් හිමියාගෙන් පවරාගෙන නොතිබුණු අතර, ළිඳෙහි ජල ධාරිතාවය ප්‍රමාණවත් බව හා ජල යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂණ කටයුතු සිදුකර තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 23 දින ඉදිරිපත් කර ඇති රු.1,993,088 ක් වූ වැඩ නිමවුම් බිල්පත් වටිනාකම 2017 ජනවාරි 17 දිනැතිව ප්‍රතිපූර්ණය වී තිබුණි. බිල්පතෙහි ඇතුළත් වටිනාකම රු.1,953,033 ක් වූ වැඩ විෂයයන් 12 ක් 2017 පෙබරවාරි 02 දින වනවිටද නිමකර නොතිබුණි.

3.9 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන මෙට්‍රික් ටොන් 04 - 4¼ ක් පමණ වන අපද්‍රව්‍ය වලින් වෙන්කරන ලද අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 2 ක ප්‍රමාණයක් දෙමටගොල්ල කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේදී කොම්පෝස්ට් සකස් කිරිමට යොදාගෙන තිබූ අතර, 2016 වර්ෂයේදී රු.73,750 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඉතිරි අපද්‍රව්‍ය කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය අසල ඉඩමට බැහැරකර පස් වලින් වසා දමා තිබූ අතර, එකතුවන අපද්‍රව්‍යවලින් විශාල ප්‍රමාණයක් පරිසරයට හානි වන අයුරින් බැහැරකරමින් පැවතුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණනය සඳහා සභාවේ නිලධාරියෙකු පත්කර තිබුණු නමුත්, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

4.2 අයවැය පාලනය

--------------------

(අ) ආදායම් විෂයයන් 2 ක් සඳහා ඇස්තමේන්තුගත රු.325,000 ක ආදායම් කිසිවක් උපයාගෙන නොතිබූ අතර, ආදායම් විෂයයන් 28 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය සියයට 39 සිට සියයට 149,950 අතර පරාසයක පැවතුණි.

(ආ) වැය විෂයයන් 17 ක් සඳහා සලසා දී තිබුණු රු.2,169,600 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 36 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර, සියයට 37 සිට සියයට 684 අතර, පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

05. පද්ධති හා පාලනය
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ණයගැති හා ණයහිමි පාලනය.
(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය.
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) අයවැය පාලනය.